1st Place Winner
National Productivity
Award 2020

SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

SLSI SYSTEM CERTIFIED ISO 9001

ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/1/1/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.12. 31 |

දකුණු පළාත්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
අමාත්‍යාංශ ලේකම් (ප්‍රධාන/ අධ්‍යාපන/ ක්‍රීඩා/ කෘෂිකර්ම/ ධීවර),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ මුදල්/පිරිස් හා පුහුණු/ ඉංජිනේරු සේවා/ සැළසුම් හා මෙහෙයුම්),
පළාත් ආදායම් කොමසාරිස්,
සමුපකාර සේවක කොමිෂන් සභාව.

**<u>1990 අංක 28 දරණ පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව බලතල පැවරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/5/1/17A හා 2022.12.05 ලිපිය හා බැඳේ.

02. එමගින් බලතල පැවරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 සංශෝධනය කර ඇති බවත්, චක්‍රලේඛ අංක 01/2019 (x) හා (xi) සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බවත් දන්වා ඇත.

03. එකී සංශෝධනය අනුව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 (x) හි උපලේඛන අංක V යටතේ දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවය/ දකුණු පළාත් සංවර්ධන නිලධාරි සේවය/ දකුණු පළාත් තොරතුරු තාක්ෂණ සේවය/ දකුණු පළාත් අභ්‍යන්තර විගණන සේවය/ දකුණු පළාත් කාර්යාල සේවක සේවය / දකුණු පළාත් රියදුරු සේවය යන සේවාවන්හි නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සහන ලබාදීම සම්බන්ධ බලතල දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත පවරා ඇති බව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියමය පරිදි දන්වා ඇත.

04. එසේම, බලතල පැවරීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද අංක 01/2019 චක්‍රලේඛයේ උපලේඛන අංක IV, V, VII, X සලහ XI, XII හි කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීම සම්බන්ධ බලතල 01/2019 (x) උපලේඛනයේ ඇමුණුම් අංක 01 පරිදි සංශෝධනය කර ඇති බව ද දන්වා ඇත. ඒ අනුව එහි සහතික කරන ලද පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

05. තවද, අංක 03 ඡේදයෙහි සඳහන් සේවාවන්හි නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සහන ලබාදීම සඳහා මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර අදාල ලියවිලි මා වෙත යොමු කරන ලෙසත්, අංක 04 ඡේදයෙහි සඳහන් උපලේඛනවල සඳහන් නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සහන ලබාදීම සඳහා පවරන ලද බලතල ප්‍රකාරව කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

**සුමිත් අලහකෝන්,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.
පිටපත - සහකාර ප්‍රධාන ලේකම් (පාලන) - දැ.ගැ.ස.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.